**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 14 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | -------------------------------- |
| (අ) | පර්චස් 11 ක ප්‍රමාණයෙන් යුත් පදිංචි පන්කියේ ගෙදරවත්ත ඉඩමේ අගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දි ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරිනියකගෙන් වාරික ලෙස අය කළ රු.167,582 ක් වූ ණය මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී රජයේ අරමුදලට බැර කරන බව දන්වමි. |
| (ඇ) | 2018 වර්ෂයේ දී, වැන්දඹු හා අනත්දරු අරමුදලට ලියන ලද රු.62,904 ක වටිනාකමින් යුත් චෙක්පතක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | අදාළ ආයතන සඳහා ගෙවීම් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | හානි රක්ෂණ බැඳුම්කරය ලද පසු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | --------------------------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 02 ක ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.10,194,032 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම්<br>අවුරුදු 05 ක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.109,951 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර හිඟ ශේෂය රු.2,113,105 ක් විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි අය කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම්<br>අවුරුදු 05 ක් ඉක්ම වූ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.3,283,123 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දි නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.22,558,489 ක් වටිනා ගිණුම් විෂයයන් 02 කට අදාළ වත්කම් ලේඛන හා බිල්පත් ආදිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරන බව දන්වා ඇත. |

**1.3.5 <u>අනුකූල නොවීම</u>**

**1.3.5.1 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි පරීක්ෂා කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො. චක්‍රලේඛ අංක 2016/03 | | | |
| (i) | 06 වගන්තිය | පූජාපිටිය වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 33 ක් සඳහා නව තක්සේරුව මත ගිවිසුම්ගත වී නොතිබුණි. | අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුවේ. | නව ගිවිසුම් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 05(I) ඡේදය | අඹතැන්න වෙළඳ සංකීර්ණයෙන් 2007 වර්ෂයේ තක්සේරුව මත කඩ කුලි අය කරමින් පැවතුණි. | අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුවේ. | මහා සභාවේ අනුමැතිය නොලැබීම මත නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දන්වමි. |
| (iii) | 10 වගන්තිය | පූජාපිටිය වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 06 ක් අතුරු බදු දී තිබුණි. | අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුවේ. | මහා සභාවට යොමු කර ඇති අතර, ඉදිරියේ දී ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,217,809 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,721,181 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,200,000 | 3,216,947 | 2,400,833 | 816,114 | 3,113,959 | 3,187,984 | 2,523,167 | 2,744,670 |
| (ii) | කුලී | 3,978,600 | 2,788,206 | 2,631,811 | 156,895 | 3,957,540 | 2,578,603 | 2,727,587 | 364,976 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,073,000 | 2,118,250 | 2,118,250 | -- | 2,217,100 | 2,449,000 | 2,449,000 | -- |
| (iv) | වෙනත් ආදායම් | 18,652,560 | 22,278,084 | 6,465,433 | 16,042,482 | 17,221,000 | 17,366,135 | 7,243,607 | 28,642,420 |
| | එකතුව | 27,904,160 | 30,401,487 | 13,616,327 | 17,024,991 | 26,509,594 | 25,581,725 | 14,943,361 | 31,752,066 |

#### 2.2.2 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ බදු ආදායමෙන් රු.816,114 ක් අය කර නොතිබුණි. | බදු මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.880,922 ක් හා මුද්දර ගාස්තු රු.17,492,397 ක් විය. | ලැබිය යුතු මුදල් ලබා ගත යුතුවේ. | මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කළමනාකරණය සඳහා ඉඩමක් ලබා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත රු.400,000 ක මුදලක් ගෙවා තිබූ නමුත්, අදාළ ඉඩම පවරා ගෙන නොතිබුණි. | ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | ඉඩම අත්පත් කර ගැනීම සඳහා වූ සියලුම කටයුතු සිදු කරමින් පවතී. |

(ආ) ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බල ප්‍රදේශය තුළ පවතින ජල ව්‍යාපෘති 25 න් ව්‍යාපෘති 08 ක ජල සාම්පල් අසතුටුදායක බව හා එක් ව්‍යාපෘතියක ජල සාම්පල් සැක සහිත බව වාර්තා වී තිබූ බැවින්, ජල ව්‍යාපෘති 25 හි ජලය මහජන පරිභෝජනයට සුදුසු ද යන්න පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් පැවතුණි. | පරීක්ෂා කිරීම් මඟින් ලද ප්‍රතිඵල අනුව, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ජල සාම්පල් පරීක්ෂණයක් කොට්ඨාශ මට්ටමින් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් විවිධ වූ කාර්යයන් ක්‍රියාත්මක කරන නමුත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ කෙසේ ගැළපේ ද, යන්න පිළිබඳ ඇගයීමක් හා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | පසු විපරම් ක්‍රියාවලිය විධිමත් කළ යුතුවේ. | පසු විපරම් කිරීම හා වාර්තා පිළියෙල කිරීම ඉදිරියේ දී සිදු කරන බව දන්වා ඇත. |

**3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු තනතුරු 17 ක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් මඟින් ඉල්ලීම් කළ ද, පුරප්පාඩු සම්පූර්ණ නොවූ බව ප්‍රකාශ කර ඇත. |

**3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **දේපළ බදු දීම සම්බන්ධ අඩුපාඩු** | | |
| අංකුඹුර වෙළඳ සංකීර්ණයෙන් කඩ කාමර කුලී අය කිරීමේ දී, 2016 ජූනි 30 දින ලබා දී ඇති නව තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | කඩ හිමියන්ගේ විරෝධතා මත නව තක්සේරු ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් පවතී. |

**3.4 <u>වත්කම් කළමනාකරණය</u>**

**3.4.1 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තොරතුරු සොයාගත නොහැකි ඉඩම් ලේඛනයේ පවතින ඉඩම් ඒකක 05 කට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණයක් මඟින් ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

**3.4.2 <u>පවරා නොගත් වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ වෑන් රථය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | විධිමත් පරිදි පැවරීමට අදාළ ආයතනය කටයුතු කර නොමැති බව දන්වමි. |

**3.4.3 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.18,277,492 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 08 ක් නිෂ්කාර්යව පැවතුණි. | යන්ත්‍ර හා උපකරණ මඟින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් විසින් නිර්දේශ ලබා දී ඇති අතර, ඉදිරියේ දි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5** <u>වාහන උපයෝජනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව භාවිතයට නොගන්නා රු.19,527,492 ක් වටිනා වාහන 10 ක් සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | පරීක්ෂා කර, නිවැරදි ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් විසින් නිර්දේශ ලබා දී ඇති අතර, ඉදිරියේ දි ඒ අනුව කටයුතු කරන බව දන්වමි. |